ඕස්ට්‍රේලියාවේ සිට ඉන්දුනීසියාව ට කාලයක් තිස්සේ කෙරුණු මස් පිණිස හරක් වෙළඳම පසුගිය ද හදිසියේ ම වාගේ තහනම් කරන්නට යෙදුණි. මේ කර්මාන්තයේ නියැළෙන උතුරු ප්‍රාන්තයේ විශාල පිරිසකගේ ජීවන මාර්ගය තාවකාලිකව නැති කෙරුණු මේ ඕස්ට්‍රේලියානු මධ්‍යම රජයේ තීරණය ට ආසන්නතම හේතුව වූයේ "ඒබීසී" රූපවාහිනී නාලිකාවේ "ෆෝ-කෝනර්ස්" නම් වූ වැඩ සටහනකි.

ආන්දෝලනයක් ද පසුගිය දිනක පැතිර ගියේ ය. ගවයින් ඝාතනය කරනු නොව, ඝාතනය පිණිස ගවයන් ගෙන යන අයුරු දුටු අය ද ගව මස් කෑම අත්හැරිය බවට කියවෙන උපකථායාන කතන්දර අපි බොහෝ දෙනෙකු අසා ඇත්තෙමු. ඇල්. ඇම්. පෙරේරා ගේ -හතර මහා නිධානය" චිත්‍රපටයේ එන -උම්බෑ කිය කියා මරණ බයේ" නම් ගීතය ඇතුළත් දර්ශනය දුටු කී දෙනෙක් නම් හැටේ දශකයේ දී කම්පාවට පත් වී මාංශ භක්ෂණය අතහැර ඇත්ද?

ව්‍යාකරණයෙනි.
ගමේ නිවසක හැදි වැඩී, ඒ නිවසට අවශ්‍ය කිරි ලබාදෙමින්, ඒ වෙනුවෙන් නිසි සැප සත්කාර ලබමින් ජීවත් වූ සුද්දී, නිසි පරිදි මස් සඳහා ගවයන් ඇති කිරිණීමේ ව්‍යාපාරයක් නොමැතිකම නිසා ලංකාවේ බිහි වී ඇති හොර හරක් ජාවාරම්කරුවන් සහ ඔවුන් වෙනුවෙන් සේවය කරන හරක් හොරුන් ගේ ග්‍රහණයට අසුවී දුක් විඳීමත්, තම මරණයට සුළු මොහොතකට පෙර එයින් ගැලවී නැවත තම සුපුරුදු ගැමි පරිසරය වෙත යෑමත් සුද්දී නවකතාවේ ඉතා නිර්මාණාත්මකව ඉදිරිපත් කර ඇත.

"සුද්දී" නවකතාව තුළ සුද්දී ගේ ජීවිත කතාවට පරිබාහිර,




නමුත් වක්‍රාකාරයෙන් සම්බන්ධ, විවිධ අතුරු කතා කිහිපයක් ද බුද්ධදස අබයසිරිවර්ධන විසින් අපට ඉදිරිපත් කර ඇති බව සඳහන් කළ යුතුය. මෙයින් මා වඩාත් සිත් ගත්තේ නගරයේ පාපකාණ්ඩී ලෙස හැදී වැඩෙමින් සිට ගමට පළා එන -ඇල්පි" නම් චරිතය වේ. ඇල්පි මට සිහි කලේ, මඩොල්දූවේ

සුරංචියා ගේ චරිතයේ අප නෑසූ කුඩා අවදියයි.

තිරිසනෙකු ප්‍රධාන චරිතය ලෙස ගෙන උගේ දෘෂ්ඨි කෝණයෙන් පරිසරය සහ සිදුවීම් ප්‍රථම පුරුෂයෙන් විස්තර කරමින් රචනාවක් කිණීරීම ඉතා කැපවීමකින් සහ සංයමයකින් කළ යුතු කාර්යයකි. -සුද්දී" රචනා කිණීරීමේ දී කතුවරයා ඒ අභියෝගය හොඳින් ජයගෙන ඇති බව කිය යුතුය. බුද්ධදස අබයසිරිවර්ධන විසින් මේ කෘතියෙහි ලා භාවිතා කර

**රසික සූරියආරච්චි**

ඇති භාෂා විලාසය තත්කාලීන භාවිත සිංහලයට වඩා තරමක් පැරණි බව බැලූ බැල්මට පෙනේ. බොහෝ දුරට එයට හේතුව වී ඇත්තේ රචකයා දශක ගණනාවක් තිස්සේ මව් රටින් දුරස්ව කල් ගත කිණීරීම විය හැකි ය. එසේ වතුදු, "සුද්දී" නවකතාව පසුබිම් වී ඇති හැටේ දශකයේ පරිසරයට ඒ භාෂා ශෛලිය අපූරුවට ගැලපෙන බව මගේ අදහසයි. හරකුන් වද දී මරණු දැක අප බොහෝ දෙනෙක් මා මුලින් දැක්වූ පරිදි කම්පා වුවද, පසුගිය දිනක බ්‍රිතාන්‍යයේ "චැනල් ෆෝ" නමැති නාලිකාවෙන් මිනිසෙක් ගසක බැඳ පිහියකින් කපනු සහ ඉන්පසු ඔහු මරා දමා තිබෙණු දැක කම්පා වූයේ අප කීයෙන් කී දෙනාද? අප බොහෝ දෙනෙකු දේශප්‍රේමී කඩතුරාවක් අස්සේ සැඟවී, තම හෘද සාක්ෂියට මුකවාඩම් බැඳ, ස්වයං මුලාවකින් සිත රවටා ගෙන, සිද්ධාර්ථ ගෞතම ලා, ධර්මාශෝක ලා, මාටින් නීමොලර් ලා කියූ වදනක් හෝ නොදන්නා සේ ඉඳිනු දැකීමට ලැබීම අප කළ අපරාපරියවේදනීය කර්මයක පටිසන් දීමක් යැයි සිතමි.

"සුද්දී" කෘතියෙහි ලා බුද්ධදස අබයසිරිවර්ධන අපට මවා පාන්නේ ලංකාවේ ගව ඝාතනයේ මීට දශක ගණනාවකට පෙර පැවති තත්වයයි. තමා වැනිම වූ මිනිසුන් මරා, ඒ දෙස බලමින් සතුටු විය හැකි සදකාලික චණ්ඩාශෝක ලා වෙසෙන දේශයක අද පවා ඒ තත්වය එලෙසම පැවතෙන්නේ නම් එය පුදුමයක් නොවේ.

අවසාන වශයෙන්, බුද්ධදස අබයසිරිවර්ධන විසින් රචිත "සුද්දී" නවකතාව අවිහිංසාව අගයන සියළු දෙනාම විසින් කියවා අගය කළ යුතු කෘතියක් යැයි සඳහන් කරමි. විශේෂයෙන් ම මෙය ළමුන් ට ද එකසේ ගැලපෙන නවකතාවකි.

# සුද්දී

## බුද්ධදස අබයසිරිවර්ධන ලියූ අපූරු නවකතාවක්

මස් පිණිස ඉන්දුනීසියාව ට අපනයණය කරණ ඒ ගවයින් මරණයට පෙර කෘර වද හිංසාවලට ලක් කෙරෙන ආකාරය ඒ වාර්තාමය වැඩ සටහණින් පෙන්වා දුන්නේ එය නැරඹූ සියළු දෙනාම පාහේ ශෝකයටත්, කෝපයටත් පත් කරමිණි.

මේ ආකාරයෙන් කම්පා වූයේ සත්ව අහිංසා සංගමය සහ සාමාන්‍ය ජනතාව පමණක් නොවේ. මස් පිණිස සතුන් ඇති කරන්නෝ ද කම්පා වූහ. එයට හේතුව නම්, මරා මස් ගැනීම පිණිස සතුන් ඇති කළ ද, ඒ සතුන් ගේ මරණය සිදුවිය යුත්තේ පීඩාකාණීරී අයුරින් නොවන බවට ඔවුන් පවා පිළිගන්නා නිසා ය. මිනිස් අයිතිවාසිකම් සුරුකුණු මෙවැනි රටක සත්ව කොට්ටාශ දෙසට ද කරුණා ඇස එලෙස යොමුවීම බලාපොරොත්තු විය යුත්තකි. එය දියුණු සමාජයක ලක්ෂණයක් යැයි මම හඟිමි.

ශ්‍රී ලංකාවේ ද ගවයින් ඇතුළු සතුන් ඝාතනය කරන්නේ කෘර වද හිංසා පැමිණවීමෙන් පසුව යැයි මම අසා ඇත්තෙමි. හලාවත පැත්තේ කෝවිලක සත්ව බිලි පූජාවක් පිළිබඳව විශාල

ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර වාසී බුද්ධදස අබයසිරිවර්ධන පසුගිය වසරේ දී ලියා පල කරන ලද සිය ප්‍රථම කෘතිය වන -සුද්දී" නම් වූ නවකතාව මුළුමණින් ම පාහේ කැප වී ඇත්තේ, ලංකාවේ පසුබිමක් තුල, ගව ඝාතනයේ කුරිරුකම පිළිබඳව පාඨක අවධානය යොමු කිණීරීමට බව පෙනේ.

ලංකාවේ මූලික ඉගෙනුම ලබා නවසීලන්තයෙන් සහ එංගලන්තයෙන් වැඩිදුර අධ්‍යාපනය ලද බුද්ධදස අබයසිරිවර්ධන වෘත්තියෙන් භෞත-චිකිත්සකවරයෙකි.

තමා කොළඹ ගව ඝාතනාගාරය අසලදී දුටු සිදුවීමක් පාදක කොටගෙන, පසුගිය සියවසේ මැද භාගයේ දකුණු ලංකාවේ ගැමි සමාජය පසුබිම විස්තරාත්මකව ඉදිරිපත් කරමින් ඔහු රචනා කර ඇති "සුද්දී" නවකතාවේ මා දුටු අතිශය සුවිශේෂී ලක්ෂණය නම් මෙහි ප්‍රධාන චරිතය වන්නේ සුද්දී නම් එළදෙන වීමයි. එපමණකුදු නොව මුළු කතාවම රචනා වී ඇත්තේ සුද්දී ගේ උත්තම පුරුෂ

---

අපේ උරුමය

වී. ජී. මිගෙල් (සරත්)

# ඕකා සීපද

ඈත අතීතරයේ අපේ සිංහල ගැමි කවියා තම කවිය තව දුරටත් විස්තර කිරීමට රසවතක් කිරීමට ඕකා සීපදය යොදා ඇති බව පෙනෙයි

ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැළණි ගඟේ ඔරු යනවා බලා වරෙන්
සාදුකාර දී ඔරුවක නැඟී වරෙන්

මෙම කවියට එකතු වූ ඕකාව බලන්න

කෑදට කෑදක් කෑදට කෑදක් ගජිත කුදක් කී
ඩිංගිරි මැණිකෝ
පදිනවෝ පදිනවෝ// පාරු පදිනවෝ
මැංගිරි ඩිනිකෝ ඩිංගිරි මැණිකෝ
ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්

රිඟට රිඟක් රිඟට රිඟක් ගජිත කුදක් කී
ඩිංගිරි මැණිකෝ
රිදෙනවෝ රිදෙනවෝ// දෑත රිදෙනවෝ
මැංගිරි ඩිනිකෝ ඩිංගිරි මැණිකෝ
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්

කැළණි ගඟත් වලවෙ ගඟත් // තලනවෝ තලනවෝ//
දෙගොඩ තලනවෝ
මැංගිරි ඩිනිකෝ ඩිංගිරි මැණිකෝ
කැළණි ගඟේ ඔරු යනවා බලා වරෙන්

එගොඩත් මෙගොඩත් //
දෙගොඩ ගොඩම කෝ ඩිංගිරි මැණිකෝ
මැංගිරි ඩිනිකෝ ඩිංගිරි මැණිකෝ
සාදුකාර දී ඔරුවක නැඟී වරෙන්

### කුරුඳු ඕකාවක්

කොස්දෙල් වාරයක් ද වැල වරකා වාරයක් ද
මොන ඇන්නා වාරයක් ද මන් දන් නෑ

වාරේ කුරුඳු විකුණාලා එන කල ට

ඉහලින් ආ පාරක්ද පහලින් ආ පාරක් ද
මොන ඇන්නෑ පාරක් ද මන් දන් නෑ

පාර වැරදිලා ගොස් කටු ගස්තොටට

රත්තරනින් කල මාලයක් ද රිදියෙන් කළ මාලයක් ද
මොන ඇන්නෑ මාලයක් ද මන් දන් නෑ

මාලේ කර ලාන අඟනක් එගොඩ සිට

ඉස්සර නෑ වාසියක් ද දැං කාලේ නෑ වාසියක් ද
මොන ඇන්නෑ වාසියකන් ද මන් දන් නෑ

හුරේ වරෝ කී රති ගඟ පීනනන්ට
(හුරේ ඔරුව පැදපං කීවා ය මට)

### අවුරුදු ඕකාවක්

හාවුන්ඩ මුවන්ඩ වල් ඌරන්ට වෙඩි තියන්ඩ
හෙමින් හෙමින් කිට්ටු කරන්නා සේ

හෙමින් හෙමින් මම හේනට යන කල ට

අත්තා, මුත්ත, නත්ත, පනත්තා, කිත්තා, කිරි කිත්තා,
කිරි කෑ මුත්තා කාලේ උස් කණාටු පොල් ගහකිං
පොල් ගෙඩි කඩන්නා සේ

එකෙක් ඇවිත් දුන්නයි මගෙ පිට මැද ට

තවද අලුත් අවුරුද්දට නැන්දා මාමාලාගේ ගෙදර ගොහිං
හොඳ බත් මාලුවක් එක්ක අවුරුදු කෑවා වගේ

ඒ ගුටි කකා මම ආපහු එන කල ට

තවද නැන්දා මාමාලාගේ ගෙදර ගොහිං
හිරිමල් නෑනා කෙනෙක් එක්ක විනෝද වෙන වේලාවට
කොක් හඬලා සිනා සෙන්නා සේ

මටම මගේ ඉල ඇට නෑ හිනාව ට

(මේ කවියේ සිංහල හත් මුතු පරම්පරාවම - අත්තා, මුත්තා, නත්තා, පනත්තා, කිත්තා, කිරි කිත්තා, කිරි කෑ මුත්තා - ඇතුළත්ව ඇති බව ඔබට පෙනෙනු ඇත)

සන්නස
වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
03 8707 4604 හෝ
0402 025 516
email ads.sannasa@gmail.com



Malini Jayasinghe Memorial
SCATS Short Drama Festival
2011

Come and Enjoy !!

a festival of stage plays
produced and presented by
outstanding new talent
in Melbourne

Date Saturday , 30th July 2011
Place Chandler Community Theatre
28, Issac Street,
Keysborough
Time 6.00 pm

Entrance
Adults $10
Children Free
(under 12)

Contacts:
Sarath Bandara 0409 195 472
Shyamon Jayasinghe 0402 025 516
Senake Perera 9801 4356
Upa Upadasa 0412 357 683

Sponsored by
Victorian Multicultural Commission and
Greater Dandenong City Council

SCATS